**දමන ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 10 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 මැයි 29 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2019 දෙසැම්බර් 31 දිනට දමන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (i) සභාව සතු කඩකාමර 43 හි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතු වේ. | පිළිගනිමි. තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. |
| (ii) 2019 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ රු.1,106,913 ක වියදමක් දරා ඉදිකර තිබුණු සතිපොළ නව වෙළඳසැල 02 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිකිරීම් වල නිම්වැඩ වටිනාකම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | පිළිගනිමි. නව ගොඩනැගිල්ල ඉදිරියේ දී ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

**(ආ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ගෙවිය යුතු ගිණුම්** | | |
| 2017 වර්ෂයට පෙර සිට වියදම් ණයහිමියන් යටතේ දක්වා තිබුණු රු.363,850 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | මෙම මිලදීගැනීම් පිළිබඳ වෙනත් තොරතුරු හෝ ඒවා සභාව වෙත ලැබුණු බවට තොරතුරු කිසිවක් සොයාගත නොහැක. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.2,515,138 ක වත්කම් විෂයයන් 05 ක් හා රු.3,170,546 ක වගකීම් විෂයන් 05 ක් විගණනය සඳහා සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශ වල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | අදාල ගිණුම් විෂයන් සම්බන්ධව තොරතුරු සොයාගත නොහැක. |

## 1.4 අනුකූල නොවීම

### 1.4.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම (රු.) | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ** | | | | |
| (i) | 139(1) වගන්තිය | - | වරිපනම් බදු පැනවීමට යටත් දේපලක වටිනාකම තක්සේරු කිරීමට හැකිවනු පිණිස වාර වාර්තා කැඳවීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ වන විට ආදායම් පරීක්ෂක යොමුකර මෙම වාර්තා සකස් කරමින් පවතී. |
| (ii) | 159 වගන්තිය | 618,873 | 2010 සිට 2019 දක්වා කාල පරිච්ඡේදය තුල සභාව විසින් බදු දී තිබුණු කඩකාමර 35කින් හිඟ කඩ කුලිය අයකර ගෙන නොතිබුණි. | ප්‍රාදේශීය සභා පනතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | හිඟ කඩකුළිය සම්බන්ධව බදු කරුවන් දැනුවත් කර ඇත. අය කර ගැනීමට කටයුතු කරමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | **1988 ප්‍රාදේශීය සභා රීති ( මූල්‍ය පරිපාලනය)** ---------------- | | | | |
| | රීති 217 | | ප්‍රාදේශීය සභාව සතු හා සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා ඉඩම් පවරාගෙන තක්සේරු වටිනාකම ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. | ප්‍රාදේශීය සභා රීති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | පවරා දීම් ප්‍රමාද වීම හේතුවෙන් ඉදිරි කටයුතු කිරීමට නොහැකි වී ඇත. |
| (ඇ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි** --------------- | | | | |
| | මු.රෙ. අංක 571 | 963,694 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ඉක්ම වූ තැන්පතු 35 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | මේ පිළිබඳව තොරතුරු සොයා බලා කටයුතු කරමි. |
| (ඈ) | **2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016** දරන **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය** | | වාහන හා යන්ත්‍රෝපකරණ 03 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාව සිදුකළ යුතු වේ. | නිතර ධාවනයේ යොදවන වාහන සඳහා ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදුකර ඇති අතර ඇතැම් වාහන අළුත්වැඩියා සඳහා යොමු කර ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**
---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,769,889 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,338,954 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තත්‍ය ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| වරිපනම් හා බදු | 970,907 | 420,906 | 255,620 | 1,713,056 | 420,907 | 659,877 | 583,052 | 1,547,770 |
| කුලී ආදායම | 4,172,626 | 2,910,849 | 2,817,875 | 618,873 | 3,144,754 | 3,916,818 | 2,939,581 | 525,899 |
| බලපත්‍ර ගාස්තු | 1,450,000 | 2,217,792 | 2,217,792 | 83,750 | 900,000 | 1,200,230 | 1,114,780 | 83,750 |
| වෙනත් ආදායම් | 4,486,100 | 3,983,345 | 3,796,304 | 1,145,448 | 3,843,500 | 3,650,672 | 5,868,388 | 958,407 |
| | **11,079,633** | **9,532,892** | **9,087,591** | **3,561,127** | **8,309,161** | **9,427,597** | **10,505,801** | **3,115,826** |

### 2.2.2 වරිපනම් හා බදු

**(අ) වරිපනම් බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2007 වර්ෂයේ වරිපනම් තක්සේරුව පදනම් කරගෙන වරිපනම් අයකිරීම සිදුකර තිබුණි. හිඟ ආදායම් ලේඛනය අනුව 2019 දෙසැම්බර් 31 දිනට හිඟ හිටි වරිපනම් රු.1,482,206 ක් වුවද හිඟ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නව වරිපනම් තක්සේරුවක් සිදුකිරීම හා හිඟ ශේෂය අයකර ගත යුතු වේ. | 2016 වර්ෂයේ සිට වරිපනම් ලේඛනය Excel Sheet පවත්වාගෙන යනු ලබන අතර එහි පවතින ශේෂය අය කර ගැනීම සඳහා වරෙන්තු නිකුත් කර ඇත. |

**(ආ) අක්කර බදු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2019 දෙසැම්බර් 31 දිනට පැවති හිඟ අක්කර බදු රු.230,850 ක් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | හිඟ අක්කර බදු අයකර ගත යුතු වේ. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(3) වගන්තිය අනුව දක්වා ඇති නීත්‍යානුකූල තත්ත්වයක් සකස් කර ගැනීමෙන් පසු මෙම මුදල් අය කර ගැනීමට කටයුතු කරමි. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1** **කාර්ය සාධනය**

------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**(අ)** **අතුරු ව්‍යවස්ථා**

-----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු නිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු වේ. | පිළිගනිමි. |

**(ආ)** **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ කසල කළමණාකරන වියදම රු.5,604,055 ක් වී තිබුණු අතර, කසල බදු පනවා එම වියදම් පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | කසල කළමනාකරණ වියදම කසල බදු පනවා අයකර ගත යුතු වේ. | කසල බදු පැනවීම සඳහා 2020.02.18 දින සභා තීරණයක් ගෙන ඇති අතර, ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කරමි. |

**(ඇ)** **තිරසාර සංවර්ධන ඉලක්ක**

-----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව විසින් එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය - 2030 පිළිබඳව දැනුවත් වී තිබුණු අතර, හඳුනාගත් අරමුණ හා ඉලක්ක මැනීම සඳහා දර්ශන හඳුනාගෙන නොතිබුණි. | ඉලක්ක හා අරමුණු මැනීම සඳහා දර්ශක හඳුනාගත යුතු වේ. | පිළිගනිමි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව සතු දීර්ඝ කාලීනව බදු දී තිබුණු කඩකාමර 35 කින් 2010 සිට 2019 දක්වා කාල පරිච්ඡේදයට අදාලව අයවිය යුතු රු.558,039 ක් හා ගිවිසුම් ප්‍රකාරව අයකරගත යුතු 10% ක ප්‍රමාද ගාස්තු රු.60,834 ක් අයකර ගෙන නොතිබුණි. | හිඟ කඩකුලී හා ප්‍රමාද ගාස්තු අයකරගත යුතු වේ. | නිසි පරිදි ගිවිසුම් අත්සන් කර නොමැති බැවින් මුදල් අයකර ගැනීමේ අපහසුතා ඇති නමුත් සිහි කැඳවීම් ලිපි යොමුකිරීම් සිදුකර ඇති අතර මුදල් ගෙවන අවස්ථාවේදී දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| **සේවක පුරප්පාඩු සහ අතිරික්තය**<br>2019 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 08 ක පුරප්පාඩු 11 ක් පැවතුනි. | කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කළ යුතු වේ. | පිළිගනිමි. |

**3.4 වත්කම් කළමනාකරණය**

**නඩත්තුව හා අලුත්වැඩියාව සිදු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු අලුත්වැඩියා කළ යුතු මට්ටමේ පවතින වාහන 02 ක් දීර්ඝ කාලයක් තිස්සේ අලුත් වැඩියාවකින් තොරව ගොඩනැගිලි පරිශ්‍රයේ ගාල්කර තිබුණු අතර, එම වාහන අලුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම සම්බන්ධයෙන් සභාවේ අවධානය යොමු වී නොතිබුණි. | වාහන අලුත්වැඩියාවක් නිසි පරිදි සිදුකර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතු වේ. | EP JZ – 4488 හා EP RA – 2004 ට්‍රැක්ටර් දෙක ඉදිරියේදී අලුත්වැඩියා කිරීමට කටයුතු කරමි. සභාවේ ආදායම් තත්ත්වය අනුව මෙම කාර්යන් සිදුකළ යුතුව ඇති හෙයින් ප්‍රමාද වීම් සිදු වේ. |